# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2260/12 - 2021 දෙසැම්බර් මස 27 වැනි සඳුදා - 2021.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

පළමුවැනි සංශෝධනය

2017 අප්‍රේල් 07 දිනැති හා අංක 2013/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 දෙසැම්බර් මස 24 වැනි දින.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 පරිච්ඡේදය යටතේ සඳහන් සියලුම කරුණු වෙනුවට පහත සඳහන් කරුණු ඇතුළත් කරනු ලැබේ.

10.3 විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීම :

10.3.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| සේවා පළපුරුද්ද හා කුසලතා | 40% |
| ජ්‍යෙෂ්ඨතාවය | 60% |

***සටහන*** : විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේ දී පුරප්පාඩු ගණනය කළ යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට ය.

10.3.2 සේවා පළපුරුද්ද හා කුසලතා යටතේ බඳවා ගැනීම :

10.3.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) සේවා ගණයේ I වැනි ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයා ගෙන තිබීම.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

හෝ

ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගයේ පළමුවැනි භාගයේ I හා II කාණ්ඩ සහ දෙවැනි භාගයෙහි II කාණ්ඩයෙහි (අ) හා (ආ) කොටස් යන විෂයයන්ගෙන් සමත් වීම.

10.3.2.2 බඳවා ගන්නා ආකාරය

විශේෂ ශ්‍රේණියේ දෙසැම්බර් 31 වැනි දිනට පවතින පුරප්පාඩු සඳහා ඉහත සුදුසුකම් සම්පූර්ණ කළ ඉංජිනේරු සහකාරවරුන්ගෙන් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් උපලේඛන 07 හි සඳහන් පරිදි සේවා පළපුරුද්ද හා කුසලතා මත ලබාදෙනු ලබන ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

10.3.3 ජ්‍යෙෂ්ඨතාවය යටතේ බඳවා ගැනීම :

10.3.3.1 සපුරාලිය යුතු සුදුසුකම්

(i) සේවා ගණයේ I වැනි ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම.

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

(iii) අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

හෝ

ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගයේ පළමුවැනි භාගයේ I හා II කාණ්ඩ සහ දෙවනි භාගයෙහි II කාණ්ඩයෙහි (අ) හා (ආ) කොටස් යන විෂයයන්ගෙන් සමත් වීම.

10.3.3.2 බඳවා ගන්නා ආකාරය

විශේෂ ශ්‍රේණියේ දෙසැම්බර් 31 වැනි දිනට පවතින පුරප්පාඩු සඳහා ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති ඉංජිනේරු සහකාරවරුන්ගෙන් අයදුම්පත් කැඳවා එම නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

*සටහන :*

(i) විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම වාර්ෂිකව සිදු කරන අතර එක් එක් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට පවතින පුරප්පාඩු සඳහා ඉදිරි වර්ෂයේ ජනවාරි 01 වැනි දින සිට උසස්වීම් ලබා දෙනු ලැබේ.

12(I)හි සටහන

(i) සීමිත ධාරාව යටතේ ආධුනිකයින් ලෙස ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් හට ලබා දෙන පුහුණුව අවසානයේ පැවැත්වෙන පරීක්ෂණය, විවෘත ධාරාව යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන් සඳහා පැවැත්වෙන පුහුණුවට අදාළ පරීක්ෂණ මට්ටමේ විය යුතුය.

(ii) වසර තුන (03)ක වාරිමාර්ග ඩිප්ලෝමා පාඨමාලාව අවසානයේ පවත්වන විභාගයේ ලකුණු අනුව ජ්‍යෙෂ්ඨතාවය තීරණය කිරීමටත්, සෘජුව බඳවා ගන්නා ඉංජිනේරු සහකාරවරුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය තීරණය කිරීම බඳවා ගැනීමේ තරග විභාගයේ ලකුණු අනුවත් සිදුකළ යුතුය.

**උපලේඛනය - 07**

1. ජ්‍යෙෂ්ඨතාවය - ලකුණු 60

2. ක්ෂේත්‍රය පිළිබඳ දැනුම හා අවබෝධය - ලකුණු 30

| | | |
|---|---|---|
| විමර්ශන | - | ලකුණු 6 |
| ඉදිකිරීම් | - | ලකුණු 6 |
| ජල කළමනාකරණය | - | ලකුණු 6 |
| ව්‍යාපාර කළමනාකරණය | - | ලකුණු 6 |
| මෙහෙයුම් හා නඩත්තු | - | ලකුණු 6 |

3. කාර්ය සාධන ඇගයීම් (පූර්වාසන්න වසර පහක) - ලකුණු 10

| | | |
|---|---|---|
| විශිෂ්ඨ | - | ලකුණු 10 |
| සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ | - | ලකුණු 08 |
| සතුටුදායක | - | ලකුණු 06 |
| අසතුටුදායක | - | ලකුණු 00 |

EOG 12 - 0286

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.